**ශීර්ෂය 256 -: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණන කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ**.**

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳ සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.**

අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

ආ) ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 ගිණුම් කරන අඩුපාඩු**

**අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳීම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.42,684 ක ණය ශේෂය වර්ෂ පහකට වඩා වැඩි විය. | අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| ii. විශ්‍රාම ගිය නිලධාරින් 4 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 279,490 ක් වූ අතර එයින් වසර 2ත් 4 ත් අතර ණය ශේෂය රු. 132,365 ක්ද වර්ෂ පහට වැඩි ණය ශේෂය රු. 137,790 ක්ද විය. | අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | විශ්‍රාම වැටුප් පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| iii. වැඩ තහනම් කර ඇති නිලධාරින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 1,299,095 ක් වූ අතර එයින් වර්ෂ 1ත් 4ත් අතර පැවති ණය ශේෂය රු. 416,820 ක්ද වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු. 877,375 ක්ද විය. | අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග කරගෙන යනු ලැබේ. |
| iv. සේවය හැරගොස් ඇති නිලධාරින් 4 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 246,799 ක් වූ අතර එයින් වර්ෂ 2ත් 4ත් අතර රු. 206,350 ක්ද වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු. 40,449 ක්ද විය. | අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග කරගෙන යනු ලැබේ. |

**ආ) නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-16-31 ට අදාළව තැන්පත් කර වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු. 12,201,152 ක් වූ තැන්පතු 214 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**ඇ) ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කර්තව්‍යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරිම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 අ ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි විගණනය සිදු කරනු ලබන අතර ත්‍රෛයි මාසිකව විගණන කළමනාකරණ කමිටු පවත්වා |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| | | අභ්‍යන්තර විගණන වාර්තාවල හා රජයේ විගණන වාර්තාවල ඇතුලත් කරුණු පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **අ) ඌණ ඇස්තමේන්තු පිළියෙල කර තිබීම.** | | |
| වැය විෂයන් 06 කට අදාළව මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ගෙන් රු.13,437,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර මාරු කරගත් ප්‍රතිපාදනය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 315 දක්වා විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරිම කල යුතුය. | ඉන්ධන මිලෙහි පැවති උච්චාවචණය විදුලි ගාස්තු ඉහළ යාම, නව ඉදිකිරීම් වල ප්‍රමාදයන්, පුහුණු කටයුතු සිදු නොවීම හේතුවෙන් එම වැය විෂයන් වල ඉතිරි වූ ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වීම. |
| **ආ) අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබීම.** | | |
| වැය විෂයයන් 04 කට අදාළව රු. 11,097,000 ක් අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබිම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 68 දක්වා ප්‍රතිශතයක් මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරිම කල යුතුය. | අතිරේක දිස්ත්‍රික් ලේකම් ගමන් වියදම් ඉල්ලුම් නොකීරිම, දිස්ත්‍රික් ඉංජිනේරු ප්‍රසූත නිවාඩු ලබාගෙන තිබීම, වරිපනම් සඳහා වට්ටම් ලබාගෙන තිබීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම. |
| **ඇ) ප්‍රතිපාදන ඉතිරිවීම්** | | |
| වැය විෂයයන් 3 ක් සඳහා මුලික වියදම් ඇස්තමේන්තුවට අමතරව මුදල් රෙගුලාසි 66 ප්‍රකාර වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ අමතර ප්‍රතිපාදන රු.4,100,000 ක් එකතු කරගෙන තිබුණද මුදල් රෙගුලාසි 94 (1) ට අදාල නොවන ලෙස වැය විෂයන් යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු. 246,998 ක බැරකම් වලට බැඳී ඇති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 94 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව වැය විෂයන් වල වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැර කම්වලට එළඹීමට කටයුතු නොකළ යුතුය. | 2018 වර්ෂය ආරම්භයේ 2017 වර්ෂයට අදාළ බැරකම් පියවීම සිදු වන අතර ඒ සඳහා 2018 වර්ෂයේ ප්‍රතිපාදනයෙන් යම් උපයෝජනය කිරීමක් සිදු වේ. |

**ඈ) ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබීම.**

| | | |
|---|---|---|
| නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලැබී තිබීම හේතුවෙන් 2017 හා 2018 වර්ෂ වලදී ඒ සඳහා රුපියල් මිලියන 650 ක් වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. 2017 හා 2018 වර්ෂ වලට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී නොතිබූ අතර ප්‍රසම්පාදන අනුමැතිය නොලත් ව්‍යාපෘතියකට රුපියල් මිලියන 650 ක ප්‍රතිපාදන සලකාගෙන තිබීම මගින් රජයේ සමස්ථ අයවැය හිගය රුපියල් මිලියන 650 කින් වැඩි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. | 2016 වර්ෂයේදී නව ගොඩනැගිල්ල ඉදි කිරිම සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබුණද ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලැබී නොතිබුණි. එම අනුමැතිය 2019 වර්ෂයේ ප්‍රථම කාර්තුව තුළ ලැබීමෙන් පසු ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ දී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත වෙන්කර තිබූ රු 5,997,683,528 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකිරිම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි ප්‍රතිපාදනය රු. 1,717,960,354 ක් විය. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරිමට කටයුතු කළ යුතුය. | 2018 වරශය අවසානයේ රටේ පැවති දේශපාලන අස්ථාවර භාවය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ආපදා අවම කිරීමේ ව්‍යාපෘති** | | |
| 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර ආපදා අවම කිරීම සඳහා ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය වෙතින් රු.66,562,735 ක් ප්‍රතිපාදන වශයෙන් ලැබී තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා රු.59,038,484 ක් පමණක් වැයකර තිබුණි. ඉතිරිය රු.7,524,250 ක් ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය වෙත ආපසු යවා තිබුණි. | ප්‍රතිපාදන ආපසු නොයවා නිසි පරිදි උපයෝජනය කර ගැනීමට කටයුතු කල යුතු අතර භූමියේ පවතින යථා ස්වභාවය නිෂ්චිතව හඳුනාගත හැකි තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරිම කළ | ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති (ඇල මාර්ග පිළිසකර කිරීම්) වගුරු බිම් ආශ්‍රිතව ක්‍රියාත්මක කරන හෙයින් ඊට අනුරූපව ඇස්තමේන්තු සකස් කල යුතුව ඇත. භූමියේ පවතින යථා ස්වභාවය වගුරු බිම් ආශ්‍රිතව නිශ්චිතව නිගමනය කල නොහැකි නිසා අවිධිමත් දිග පළල සහ උස ආසන්න අගයක් ලෙස ගෙන ඇස්තමේන්තු සැකසීම හැර වෙනත් ක්‍රම වේදයක් නොමැත. එබැවින් අක්‍රමවත් දිග පළල වෙනුවට මධ්‍යන අගයක් සඳහා ඇස්තමේන්තු සැකසීම සිදු කරනු ලබයි. එබැවින් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැයවන මුදල් ප්‍රමාණයේ අඩු හෝ වැඩි වීමක් සිදුවිය හැකි බව ක්ෂේත්‍රයේ සිටින ඉංජිනේරුවරු විසින් පෙන්වා දී ඇත. තවද මෙම ඇස්තමේන්තු සකස් කරන්නේ යාන්ත්‍රික් පැය ගණන අනුව බැවින් යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ ක්‍රිය කිරීමේ |

| | | |
|---|---|---|
| | යුතුය. | ප්‍රමාණය හා හැකියාව අනුවද යම් වෙනස්කම් ඇති විය හැකි බව පෙන්වා දිය හැක.එසේම මෙම ව්‍යාපෘති වලට අදාල සියළුම ඇස්තමේන්තු සකස් කරන ලද්දේ රාජ්‍ය අංශයේ වගකිව යුතු ආයතනයක් වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසිනි.<br><br>එබැවින් ඉහත සදහන් හේතු නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදී ඇස්තමේන්තු මුදලට වඩා අවසන් ගෙවීම් අඩු වී ඇතිමුත් මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇති බව දිස්ත්‍රික් ඉංජිනේරු හා ආපදා කළමනාකරණ ඒකකය නිරීක්ෂය කර ඇත.<br><br>එසේම 2015 වර්ෂයේ සිට මේ දක්වා සිදු කරන ලද ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සියල්ල සාර්ථකව නිසි ලෙස නිමකර ඇති බව හා පසු ගිය වර්ෂ අවසානයේ අධික වර්ෂාවක් පැවතියද එම ප්‍රදේශ වලට ගංවතුර ආපදා ඇති නොවූ බව දන්වා සිටිමි. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **අ) අත්තනගල්ල** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>• ප්‍රාදේශීය ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන යටතේ හදුනාගත් ප්‍රතිලාභීන් තිදෙනෙකු සඳහා ජුකී මැෂින් ලබාදීම වෙනුවෙන් රු.123,600 ක ප්‍රතිපාදන වෙන්කර මිල කැඳවුම් කර තිබුණද ඉදිරි කටයුතු සිදු නොවී ප්‍රතිපාදන නැවත පවරා දී තිබුණි.<br><br>• සමාජ සංස්කෘතික හා නිවාස සංවර්ධන වැඩ සටහන යටතේ හදුනාගත් ප්‍රතිලාභීන් 11 දෙනෙකු සඳහා නිවාස හා ගොඩනැගිලි ද්‍රව්‍ය ආධාර ලබාදීම වෙනුවෙන් රු.226,600 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද එය ක්‍රියාත්මක නොවී මුදල් නැවත පවරා දී තිබුණි. | නියමිත ප්‍රතිලාභින් හදුනා ගැනිම කෙරෙහි අවධානය යොමු කල යුතුය.<br><br>වෙන්කල ප්‍රතිපාදන නිසි පරිදි උපයෝනය කිරීම කෙරෙහි සැලකිලිමත් විය යුතුය. | අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කරන ලද 2018/11/08 දිනැති ලිපියට අනුව ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් නොකරන ලෙස දන්වා තිබූ හෙයින් සහ, දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ගනු ලබන තීරණ වලට අනුව,ප්‍රාදේශීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ හදුනාගත් ප්‍රතිලාභීන් තිදෙනෙකු සඳහා ජුකී මැෂින් ලබාදීම (රු.123,600/=)සමාජ සංස්කෘතික හා නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 11 දෙනෙකු සඳහා නිවාස හා ගොඩනැගිලි ද්‍රව්‍ය ආධාර ලබාදීම (රු.226,600/=) |

| | | |
|---|---|---|
| | | යන ව්‍යාපෘති වල, ප්‍රතිපාදන නැවත පවරා දෙන ලදී. |
| ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක තොරතුරු පරික්ෂාවේදී වර්ෂය අවසානයේදී ව්‍යාපෘති අනුමත කර තිබූ අතර මෙම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති වල ප්‍රගතිය 50% කට වඩා අඩු මට්ටමක පැවති අතර ඇතැම් ව්‍යාපෘති ආරම්භ කර ද නොතිබුණි.<br><br>සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක ව්‍යාපෘති වටිනාකම රු. 1,282,408,701 ක් වූ ව්‍යාපෘති 931 ක් ක්‍රියාත්මක නොකර පැවතුණි. | අනුමත ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කරන ලද 2018/11/08 දිනැති ලිපියට අනුව ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් නොකරන ලෙස දන්වා තිබීම හා සමහර ව්‍යාපෘතික්‍රියාත්මක කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම ආදී හේතු මත ව්‍යාපෘතිවල ප්‍රගතිය අඩු මට්ටමක පැවතී ඇත. රටක යම් පාලනය කල නොහැකි තත්වයන් මත ඇතිවන සිදුවීම් නිසා අප හටද එයට අවනත වීමට සිදුවීම නිසා ව්‍යාපෘති ප්‍රගතිය යම් අඩු මට්ටමක පැවති බව දන්වමි. |
| ඇ) ගම් පෙරළිය වැඩ සටහන යටතේ ව්‍යපෘති 228 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 186,700,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් ක්‍රියාත්මක කර තිබුනේ රු. 26,859,995 ක ව්‍යාපෘති 46 ක් පමණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ජා ඇල නගර සභාව වෙත පවරා දී තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට වැඩ ආරම්භ කර නොතිබූ ව්‍යපෘති සහ කොටසක් වැඩ අවසන් කර තිබූ ව්‍යාපෘති සඳහා 2018 දෙසැම්බර් 31 දිනට සියළු වැඩ අවසන් කරන ලද බවට ව්‍යාජ ලෙස ලේඛන සකස් කර ගෙවීම් ලබා ගැනීම පිණිස ජා ඇල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර තිබූ අවස්ථා 7 ක් නිරීක්ෂණය විය. ඉදිරිපත් කර තිබූ රු. 4,681,600 ක වවුචර් වලට අදාළ ඉටු කර තිබූ වැඩ වටිනාකම රු. 896,019 ක් පමණක් බව අනාවරණය වී තිබුණි. | කල වැඩ ප්‍රමාණය පරික්ෂා කර බලා ගෙවීම් කර තිබුණද ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කිරීම හා වැඩ කටයුතු නිසි පරිදි සම්පූර්ණ නොකිරීම පිළිබඳව හේතු විමසිය යුතු වන අතර අඩක් ඉටු කර ඇති නම් ඉතිරිය සම්පූර්ණකර ගැනීම කෙරේ අවධානය යොමු කල යුතුය. | සම්පූර්ණ වැඩ කොටස් සඳහාම මෙම බිල්පත් ඉදිරිපත් කර තිබුණත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවීම් කර ඇත්තේ කරන ලද වැඩ කොටස් සඳහා පමණි. ඉතිරි වැඩ කොටස් අවිච්ඡේද කර නැවත ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති බව දන්වමි. |
| ඇ) වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ වැඩ සටහන් යටතේ ව්‍යාපෘති 09 ක් අවිච්ඡේද කර තිබූ අතර ව්‍යාපෘති නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම ඊට හේතුව ලෙස සඳහන් කර තිබුණි. මෙම ව්‍යාපෘති 2018 ඔක්තෝම්බර් මස ගිවිසුම් අත්සන් කර තිබුණු අතර කාලය ප්‍රමාණවත් නොවීම ලෙස හේතුව සඳහන් කිරීම පිළිගත නොහැකි වන අතර මෙම අවිච්ඡේද ව්‍යාපෘති 09 අතුරින් ව්‍යාපෘති 03 ක කටයුතු 2019 මැයි මස වන විටත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිපාදන උපරිමයෙන් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ වැඩසටහන යටතේ අවිච්ඡේද වූ මෙම ව්‍යාපෘති 9 වැඩ 2019 ජුනි 07 වන විට අවසන් කර ඇති අතර ව්‍යාපෘති 7ක ගෙවීම්ද සිදු කර ඇත. අනෙක් වවුචර් ප්‍රාදේශීය සභාවෙන් ලැබුණ පසු ඉතිරි ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. |

### 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අ) මීනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ලියා පදිංචි සමිති 03 ක් වෙත ලබා දී තිබූ රු. 2,889,650 ක මුදලක් අදාළ කාර්ය ඉටු නොකර සමිති බැංකු ගිණුම් වල 2019 මැයි වන විටත් රඳවාගෙන තිබුණි. | වෙන්කල මුදල් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | සමිතිවලට මුදල් නිදහස් කිරිම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදුන් උපදෙස් අනුව එම මුදල් අදාල සමිතිවල ගිණුම් වලට බැර කර ඇති අතර එම මුදල් යොදාගෙන කණ්ඩායම්ගතවීම්, ණය ක්‍රියාවලියට අදාල ගෙවීම් කිරීම් පිළිබඳ උපදෙස් පසුව ලබා දී ඇති අතර අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| ආ) වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 03 කට රු. 2,989,650 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර එක් සමිතියකට රු. 996,550 බැගින් ප්‍රතිපාදන ලබා දි තිබුණි. එම සමිති වල 2018.12.31 දිනට සත්‍ය වියදම පිළිවෙලින් රු. 29,500 ක් , රු. 200,000 ක් හා රු. 25,000 ක් පමණ වීම නිසා චක්‍රිය අරමුදල ක්‍රියාත්මක කිරිමට 2019 මැයි වන විටත් කටයුතු නොකර රු. 2,735,150 ක් ගිණුම් වල රඳවා ගෙන තිබුණි. | වෙන්කල මුදල් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම කල යුතුය. | සමිතිවලට මුදල් නිදහස් කිරිම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදුන් උපදෙස් අනුව එම මුදල් අදාල සමිතිවල ගිණුම් වලට බැර කර ඇති අතර එම මුදල් යොදාගෙන කණ්ඩායම්ගතවීම්, ණය ක්‍රියාවලියට අදාල ගෙවීම් කිරීම් පිළිබඳ උපදෙස් පසුව ලබා දී ඇති අතර මේවන විට අදාල කටයුතු සිදු කරමින් පවතී. |

### 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අ) මහර ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ 2014.07.15 දින සිදු වු සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) ආ ප්‍රකාරව පවත්වන ලද පරීක්ෂණ මණ්ඩල අවසන් වාර්තාව අනුව මෙම මුදල් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් සමස්ථ අධීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්, ගණකාධිකාරි, මුදල් සහකාර සහ සරප් යන නිලධාරින්ගේ රාජකාරි කටයුතු වල පැවති අඩුපාඩු, නොසැලකිලිමත් බව හා අනවධානය හේතු වී ඇති බැවින් මෙමගින් රජයට සිදු වූ අලාභය එම නිලධාරින් හතර දෙනාගෙන් අයකර ගත යුතු බවට යෝජනා ඉදිරිපත් කර තිබුණි. මේ අනුව අලාභය රු. 1,082,245 ක මුදල මෙම නිලධාරින් සිව් දෙනා අතර සමානව බෙදමින් අයකර | අදාල අනුමැතින් ලබාගෙන මෙම මුදල් අයකර ගැනීම සිදුකල යුතුය. | ඒ අනුව අදාල අලාභය වන රු.1,082,245.42ක මුදල වගකිව යුතු නිලධාරීන් ලෙස(පරීක්ෂණ මණ්ඩල අවසන් වාර්තාවේ සඳහන් පරිදි) ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරි, මුදල් සහකාර හා සරප් යන නිලධාරීන්ගෙන් සමානව අය කිරීම දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර, ස්වදේශ කටයුතු |

| | | |
|---|---|---|
| ගැනීමට දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර අනුමැතිය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත 2018.08.06 දින දැනුම් දි තිබුණද 2019 මැයි වන විටත් අනුමැතිය ලැබී නොතිබුණ බැවින් අලාභය අයකර ගැනීමට කටයුතු කිරීමට නොහැකිව තිබුණි. | | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා 2018 අගෝස්තු 06 දිනැතිව ලිපියක් යවන ලද අතර, අනුමැතිය ලැබී නොමැති බැවින් 2018.09.19, 2018.10.23 හා 2018.11.07 හා 2019.01.22 දිනැතිව සිහිකැඳවීම් ලිපි යවා ඇත. |
| ආ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල කැබ් රථයක් 1999.07.09 දින අනතුරට පත්ව තිබූ අතර මුදල් රෙගුලාසි 104 (3) යටතේ අලාභයන් පිලිබඳව ප්‍රාරම්භක වාර්තාව අනුව අනතුර සිදු කල වෑන් රථයේ රියදුරු මේ සඳහා වගකිව යුතු බවත් වාහනය අළුත්වැඩියා සඳහා යන වියදම අදාල වෑන් රථයේ රක්ෂණයෙන් අයකර ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව වාහනය අළුත්වැඩියාව වෙනුවෙන් රු.204,360 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් අනතුරට පත්කල වෑන් රථයේ රක්ෂණ සමාගම විසින් රු.15,000 ක් පමණක් ගෙවීමට එකඟ වී තිබුණි. ඉතිරි අලාභය වන රු.189,360 ක් අයකර ගැනීම සඳහා අනතුර සිදු කල රියදුරුට විරුද්ධව නීතිපතිතුමා විසින් නඩු පවරා තිබූ බවට 2001.11.05 දින වාර්තා කර තිබුණි. 2001 වර්ෂයේ සිට මෙම නඩුව සඳහා පුරා වසර 18 ක් ගත වි ඇතත් මෙතෙක් නඩුව අවසන් කර රජයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මෙම නඩුවට අදාලව නීතිපති දෙපාර්තමේන්තුවේ 2013.08.16 දිනැති ලිපිය මගින් දෙවන විත්තිකරුගේ පදිංචි ලිපිනය සොයා දෙන ලෙස දැනුම් දී ඇති අතර 2014.03.04 දින දෙවන විත්තිකරු විදෙස්ගත වී ඇති බව දන්වා ඇත. දෙවන විත්තිකරුගේ විදෙස්ගත ලිපිනය පිළිබඳව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු 2018.09.19 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. දෙවන විත්තිකරු මේ වන විට ලංකාවට පැමිණ ඇති අතර, දැනට 167/ඒ, පරණම්බලම ග්‍රාම නිලධාරි වසමේ අංක. 355 ඒ, පරණම්බලම, උස්වැටකෙයියාව ලිපිනයේ පදිංචි වී ඇති බවත් වත්තල ප්‍රාදේශීය ලේකම් 2019.05.06 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති අතර, එම තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැන්වීමට කටයුතු කරනු ඇත. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අ) මිනුවන්ගොඩ දිසා රෝහලේ 2011/2012 වර්ෂවල ඉදිකර 2014 අගෝස්තු මස විවෘත කර ඇති ශල්‍යාගාරය, නොමේරු ළදරු ඒකකය සහ ලේ බැංකු ගොඩනැගිලි සංකීර්ණයෙන් පසුගිය වසර වන විටත් ආරම්භ කර තිබුනේ ලේ බැංකුව පමණක් වන අතර 2014 වර්ෂයේ සිටම අනෙකුත් අංශ ක්‍රියාත්මක නොකිරීම මත අළුත්වැඩියා කල යුතු තත්ත්වයට පත්ව තිබූ වායු සමීකරණ පද්ධතිය මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු. 1,000,000 ක් වැය කර අළුත්වැඩියා කර ඇතත් ශල්‍යාගාරය විගණන දිනය වන 2019 මැයි 6 වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාකාරී නොවන ඒකක වෙනුවෙන් වියදම් දැරීමට හේතු විමසා බැලිය යුතුය. | ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී විසින් අවස්ථා කිහිපයකදී මෙම අඩුපාඩුව පිළිබද අදහස් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අදාල ප්‍රතිපාදන ලබා දී ඇත. එසේම ශල්‍යාගාරය, නොමේරු ළදරු ඒකකය සහ ලේ බැංකු ගොඩනැගිලි සංකීර්ණය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමක් වශයෙන් වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියා කර ඇත. ලේ බැංකුවේ කටයුතු දැනට ක්‍රියාකාරීව සිදුවන අතර ශල්‍යාගාරයේ කටයුතු ක්‍රියාත්මක නොවේ. මේ පිළිබඳව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුවත් කර ඇත. මෙම කටයුත්ත කඩිනමින් ආරම්භ කරනු ඇතැයි විශ්වාස කරමි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **අ) විශ්‍රාම වැටුප් අංශය** | | |
| (i) සාවද්‍ය ගණනය කිරීම්, චක්‍රලේඛ උපදෙස් ආදියට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක විශ්‍රාම වැටුප් හිමියන් 463 කට රු. 56,757,594 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාල වැඩිපුර ගෙවීම් වලින් 2019.03.31වන විට රු. මිලියන 8ක මුදලක් අයවී ඇති අතර ඉතිරිය වාරික වශයෙන් අයවෙමින් පවතී. 2019.06.30ට අයවීම්වල ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් විගණනය වෙත අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු ලේකම්ට පිටපතක් සහිතව ඉදිරිපත් කරනු ලැබේ. |
| (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගත යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක විශ්‍රාම වැටුප් ලබන පුද්ලයින් 426 දෙනෙකු වෙනුවෙන් ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලිපිගොනු යාවත් කාලීන කිරීමට පියවර ගත යුතුය. | ගොනු නොමැති විශ්‍රාමිකයින්ගෙන් තොරතුරු කැඳවීමක් කල අතර ඔවුන් ඉතා වයෝවෘද්ධ පුද්ගලයන් බැවින් ද බොහෝ වැන්දඹු |

| | | | |
|---|---|---|---|
| | | | විශ්‍රාම වැටුප් ලබන්නන් තම කාලාත්‍රයාගේ රැකියා විස්තර හෝ ආයතන පිළිබඳ දැනුවත් නොවීම නිසාද තොරතුරු ලබා ගැනීම අසීරු වී ඇත. අදාල පුද්ගලයින් සේවය කල ආයතන වලින්ද තොරතුරු කැඳවා සමහර ලිපි ගොනු සකස් කර ඇති අතර සමහර ආයතන වලින්ද තොරතුරු ලබාගත නොහැකි වී ඇත්තේ එම ආයතනද වසා දමා ඇති බැවිනි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා අනුමත කර නොගෙන ඇති තාවකාලික ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඉදිරියේදී අනුමත කරගැනීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (iii) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලද අයෙකු 2015.12.25 දින මියගොස් ඇති අතර මිය යාමෙන් පසුවද එම අයගේ විශ්‍රාම වැටුප් බැංකු ගිණුමට යැවීම හේතුවෙන් රු. 181,902 ක් රජයට අය විය යුතුව පැවතුණි. විශ්‍රාමිකයාගේ උරුමකරුවා 2016 සැප්තැම්බර් 14 දින මිය ගොස් තිබු අතර නියමිත දින යන්හි මරණය වාර්තා නොවීම නිසා මෙම තත්ත්වය උද්ගත වී තිබේ. | වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. විශ්‍රාමිකයෙකු මියගිය පසු අදාළ ග්‍රාම සේවක විසින් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කල යුතුය. | එම මුදල අය කර ගැනීමට උරුමකරුවෙක් නොමැති බැවින් උපදෙස් ඉල්ලා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත. |
| (iv) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 ප්‍රකාරව තවදුරටත් වැටුප් විෂමතා ඉවත් කලයුතු ගොනු සංඛ්‍යාව 2019 ජනවාරි මස අවසානය වන විට 46 ක් පැවතුණි. | විෂමතා ඉවත් කිරීමට කටයුතු කල යුතුය. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2015 ට අනුව විෂමතා ඉවත් කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව 2019 මැයි මාසය වනවිට 28 කි. මේ අතරින් හමුදා වැන්දඹු ලිපිගොනු 06 ක් ඇති අතර විෂමතා ඉවත් කිරීමට අවශ්‍ය තොරතුරු යුධ හමුදාව වෙතින් ඉල්ලා ඇති අතර එය මෙතෙක් ලබා දී නැත. ලිපි ගොනු නොමැති විශ්‍රාමිකයින් 06 |

| | | |
|---|---|---|
| | | දෙනෙකුගේ තාවකාලික ලිපිගොනු සකස්කර විශ්‍රාම වැටුප් ජනරාල්ගේ අනුමැතියට යවා ඇත. ඉතිරි ගොනුවල වැටුප් ගලපා ගත නොහැකි නිසා වැටුප් කොමිෂම වෙතින් වැටුප් පියවරවල් පිළිබදව උපදෙස් ඉල්ලා ලිපි යවා ඇත. |
| (v) කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව | | |
| • මරණය දැනුම් දීම ප්‍රමාද වීම මත බැංකු ගිණුම වෙත මුදල් ප්‍රේෂණ කරන අතර මෙම මුදල් නැවත ලබා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වේ. අවස්ථා 21 කදී රු. 17,658,002 ක් බැංකු ගිණුම් වෙත යවා තිබුණද ඒවා ආපසු එවීමට වසර 1ත් 7ත් අතර කාල පරාසයක්ගෙන තිබුණි.<br><br>• මරණය ප්‍රමාදවී දැනුම්දිම මත උරුමකරුවන් 22කට අදාළව 2016 වර්ෂයේ සිට 2018 දක්වා විශ්‍රාම වැටුප් රු. 999,234 ක් බැංකු ගිණුම් වෙත යවා තිබූ අතර එම මුදල් අයකර ගෙන නොතිබුණි. | මරණය දැනුම් දීම ප්‍රමාද නොකිරීමට මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමත් ඒ සදහා වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමටත් මුදල් ආපසු ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීමත් කළ යුතුය. | සියලුම මුදල් බැංකු මගින් ගෙන්වා ගෙන ඇති අතර මේ වන විට සියළු මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඇති බවද කාරුණිකව දන්වමි.<br><br>මියගිය විශ්‍රාමිකයින්ගෙන් රු.744,301ක මුදලක් මේ වන විට අයකර ගෙන ඇති අතර කීපදෙනෙකුගේ පමණක් රු.254,933ක මුදලක් ලැබී නොමැත. ඒ පිළිබදව බැංකුව වෙත ලිපි යවා ඇති අතර ඊට අදාල චෙක්පත් මෙතෙක් ලැබී නැත. |
| (vi) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ විශ්‍රාමිකයා මියයාම නිසි පරිදි ග්‍රාම නිලධාරි විසින් වාර්තා නොකිරීම නිසා අදාළ විශ්‍රාමිකයා මියයාමෙන් පසුවද බැංකුව වෙත යවන ලද මුදල් වලින් ආපසු ගෙන්වා ගැනීමට නොහැකි වී ඇති පුද්ගලයින් 6 දෙනෙකුට අදාළව රු. 114,225 ක් පැවතුණි. | විශ්‍රාමිකයන්ගේ මරණ පිළිබදව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ග්‍රාම නිලධාරින් දැනුවත් කළ යුතුය. | විශ්‍රාමිකයා මිය යෑමෙන් පසු ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දීමේ ක්‍රමවේදය පිළිබඳ ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇති අතර, මියගිය විශ්‍රාමිකයින් පිළිබඳ සෑම මසකම මාසික වාර්තාවක් ලබාදිය යුතු බවට ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇත. විශ්‍රාමිකයන් මිය යාමෙන් පසුවද බැංකුව වෙත බැරවූ මුදල් මියගිය අයගේ උරුමකරුවන්ගෙන් |

| | | | |
|---|---|---|---|
| | | | ග්‍රාම නිලධාරි හරහා අයකර ගැනීමට බලාපොරොත්තු වේ. |
| (vii) | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයෙකුට ද්විතිය විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම නිසා රු. 358,057 ක් වැඩිපුර ගෙවා ඇති බව 2015.09.03 වන දින හෙළිදරව් වී තිබුණි. 2015 නොවැම්බර් මස සිට රු. 5000 බැගින් මාසික වාරික වශයෙන් අයකිරීමට කටයුතු කර ඇති නමුත් 2015.12.23 දින විශ්‍රාමිකයා මියගොස් තිබුණි. මේ වන විටත් අයකරගත යුතු ශේෂය රු. 343,057 ක් වන අතර 2019 මැයි වන විටත් මෙම මුදල් අයකර ගැනිම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ද්විතියික විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ සොයා බැලිය යුතු වන අතර වගකිව යුතු නිලධාරින්ට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමත් වැඩිපුර ගෙවීම් අයකර ගැනීමත් කල යුතුයි. | වැඩිපුර ගෙවීම් හරහා ලබාගත් විශ්‍රාම වැටුප් අයකර ගැනීම් නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කරන අතර වැඩිපුර ගෙවීම් සම්පූර්ණයෙන් හෝ වාරික වශයෙන් අයකර ගනු ලබන අතර බැංකු වල ඇතුලත් මුදල් කඩිනමින් ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කරනු ලැබේ. |
| (viii) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ජීවත් වන විශ්‍රාමිකයන් පිළිබඳ කාර්යාලය තුළ ඇති විශ්‍රාම වැටුප් ගොනුව හා විශ්‍රාම වැටුප් දත්ත මූල ඇතුළත් විශ්‍රාමික තොරතුරු අතර නිවැරදි සම්බන්ධතාවයක් තිබිය යුතු නමුත් ජාතික හැඳුනුම්පත් අංකය නොමැතිව හා සාවද්‍ය ලෙස හැඳුනුම්පත් අංක සඳහන් කර දත්ත පද්ධතිය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක අවස්ථා 82 ක් නිරීක්ෂණය විය. | නිවැරදි තොරතුරු සපයාගෙන ගෙවීම් කල යුතුය. | අදාල විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවූයේ එකී විශ්‍රාමිකයන් සතුව ජාතික හැඳුනුම්පත් නොමැති වීම හේතුවෙන් වන අතර ලිපිගොනු ද පරීක්ෂා කල අතර, සමහර විශ්‍රාම වැටුප් ගොනුවලද, වාර්ෂිකව ලබාගන්නා පදිංචි සහතික වලද ජාතික හැඳුනුම් පත් අංකය සටහන් කර නොමැති විශ්‍රාමිකයන් ඇත. කෙසේ වෙතත් 2019 වර්ෂය තුල මෙම තොරතුරු නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ix) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව<br><br>• විශ්‍රාම වැටුප් අංක 01-227728 දරණ අය 2015 ජනවාරි 01 දින මියගොස් ඇති අතර ඔහු වෙනුවෙන් පවත්වාගෙන ගිය බැංකු ගිණුම වෙත 2015 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා රු. 483,937 ක මුදලක් ප්‍රේෂණය කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු. 107,621 ක් විය. මියගිය විශ්‍රාමිකයාගේ උරුමක්කරුවන් සොයා ගත නොහැකි විම මත මෙම ශේෂය අයකර ගත නොහැකිව පැවතුණි. | මෙම මුදල් අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතුය. | මියගිය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් බොහෝ කාලයක් එම ගිණුම්වල තිබීම නිසා ගැටළු සහගත තත්වයක් පැන නැඟි තිබුනත් වාර්ෂික පදිංචි සහතික ලබාගැනීම වැඩි දියුණු කිරිම තුලින් අදාල නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් ගෙන්වා ගැනිමට කටයුතු කර ඇත.මේ පිළිබඳව නිරන්තර |

| | | |
|---|---|---|
| | | අවධානය යොමු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දී ඇත. |
| • උප තැපැල් ස්ථානාධිපතිවරයෙකු විශ්‍රාම ගැනීමේදී එම නිලධාරියාට විශ්‍රාම වැටුප් සඳහා හිමිකමක් නොතිබූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඔහු වෙත විශ්‍රාම වැටුප් ප්‍රදානය කර තිබුණි. එහි මුළු වටිනාකම රු. 454,918 ක් විය. එම වරද අනාවරණය කර ගැනීමෙන් පසු රු. 46,000 ක පමණ මුදලක් අයකර ගෙන තිබූ අතර 2014.07.31 දින විශ්‍රාමිකයා මියගොස් තිබුණි. ඒ අනුව රු. 408,918 ක මුදලක් තවදුරටත් අයවීමට තිබූ අතර උරුමක්කරුවන්ගෙන්ද අයකර ගැනීමට නොහැකි වී ඇත. නිලධාරින්ගේ නොසැලකිල්ල මත සිදු වී ඇති මෙම අලාභයට අදාළ වගකිව යුතු නිලධාරින් සම්බන්ධව සොයා බැලීමේදී විශ්‍රාම වැටුප් සකස් කිරිම හා පරික්ෂා කිරිම් සිදුකළ නිලධාරින්ගේ අත්සන පමණක් ඇති බවත් ඔවුන්ගේ නම් සම්බන්ධ ප්‍රමාණවත් තොරතුරු නොමැති බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට 2019.01.09 දින දන්වා යවා තිබුණි. කෙසේ වුවද අදාළ ලිපියට පිළිතුර 2019 මැයි වන විටත් ලැබී නොතිබුණි. | ගෙවීම් පිළිබඳ අදාළ නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරී වෙත අවශ්‍ය උපදෙස්ද ලබා දී ඇත. |
| (x) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින්ගේ මියයාම් කඩිනමින් වාර්තා නොකිරිම නිසා විශ්‍රාමිකයින් 22 කට රු. 8,550,748 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වග කිව යුතු පාර්ශව හඳුනාගත යුතුය. වැඩිපුර ගෙවීම් අය කිරිමට කටයුතු කළ යුතුය. | විශ්‍රාමිකයකුගේ මියයාම අදාල වසමෙන් බැහැරව සිදුවීම, ඥාතීන්/අසල්වැසියන්ගේ නොදැනුවත්කම ආදී කරුණු හේතුකොටගෙන විශ්‍රාමිකයකුගේ මියයාම පිළිබඳ තොරතුරු නිසිපරිදි වාර්තාවීම සිදු නොවේ. කෙසේවුවද, තම වසමේ විශ්‍රාමිකයින් පිළිබඳව අවධානයෙන් සිට තොරතුරු වාර්තා කරන ලෙසට කොට්ඨාශ දින රැස්වීම් වලදී නිරන්තරයෙන් ග්‍රාම නිලධාරීන් හට දැනුවත් කිරීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (xi) | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් 07 කගේ මිය යෑම් නිසි පරිදි වාර්තා නොවීම හේතුවෙන් ඔවුන්ගේ මරණයෙන් පසුවද විශ්‍රාම වැටුප් රු. 3,022,081 ක් බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කර පැවති අතර ඒවා ආපසු අයකර ගැනීම වගකිවයුතු පුද්ගලයකු සොයාගත නොහැකි වීම නිසා අයකර ගැනීම ගැටළු සහගතව පැවතුණි. | වග කිව යුතු පාර්ශව හදුනාගත යුතුය. වැඩිපුර ගෙවීම් අය කිරිමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව මියගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරුන්ගෙන් ලබාගෙන කඩිනමින් විශ්‍රාම වැටුප් නතර කිරිමේ කටයුතු සිදු කිරිමට අවශ්‍ය උපදෙස් අදාල නිලධාරීන් වෙත ලබා දී ඇත |
| (xii) | **විශ්‍රාම වැටුප් වංචාව** | | |
| | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 01-603326 හා වැන්දඹු විශ්‍රාම වැටුප් අංක 21-500158 හිමි අයෙකු 2012 මැයි 30 දින මිය ගොස් තිබු අතර 2012 ජුනි මස සිට 2016 දෙසැම්බර් මස දක්වා එම අයගේ ගිණුමට යවා ඇති මුදල රු. 2,696,303 ක් විය. මෙම මුදල් ප්‍රමාණය මියගිය අයගේ පුතා විසින් වංචාසහගත ලෙස ATM යන්ත්‍ර හරහා ලබාගෙන තිබුණි. ඔහු විසින් මෙම මුදලින් රු. 250,000 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබූ අතර හිග මුදල වන රු. 2,388,251 මෙතෙක් අයකර ගත නොහැකිව පැවතුණි. | වග කිව යුතු පාර්ශව හදුනාගෙන රජයේ අලාභ අයකර ගත යුතුය. | දැනට මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන අතර අදාල ව්‍යාජ ලෙස විශ්‍රාම වැටුප් ලබාගත් තැනැත්තා සිරභාරයට ගෙන ඇත. මේ පිළිබඳව මු.රෙ 104ට අනුව පරීක්ෂණයක් සිදු කර ඇත. |
| (xiii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක විශ්‍රාමිකයින් 65 දෙනෙකුගේ මියයෑම් ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දීම දින 30 ත් 912 ත් අතර කාල ප්‍රමාදයක් ගෙන තිබුණි. | ප්‍රමාදයන් වලක්වා ගැනීමට මනා ක්‍රමවේදයන් හඳුන්වා දීම. | විශ්‍රාමිකයකුගේ මියයාම අදාල වසමෙන් බැහැරව සිදුවීම, ඥාතීන්/අසල්වැසියන්ගේ නොදැනුවත්කම ආදී කරුණු හේතුකොටගෙන විශ්‍රාමිකයකුගේ මියයාම පිළිබඳ තොරතුරු නිසිපරිදි වාර්තාවීම සිදු නොවේ. කෙසේවුවද, තම වසමේ විශ්‍රාමිකයින් පිළිබඳව අවධානයෙන් සිට තොරතුරු වාර්තා කරන ලෙසට කොට්ඨාශ දින රැස්වීම් වලදී නිරන්තරයෙන් ග්‍රාම නිලධාරීන් හට දැනුවත් කිරීම් කර ඇත. |

| | | |
|---|---|---|
| (xiv) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව විශ්‍රාම වැටුප් අංක 60-62944 දරන අය 2018.08.30 දින මියගොස් ඇති අතර 2018 සැප්තැම්බර් මාසය වෙනුවෙන් මිනුවන්ගොඩ මහජන බැංකු ශාඛාවේ ඔහුගේ ගිණුම වෙත බැරවූ රු. 18,924 ක මුදල් එම බැංකු ගිණුමෙන් ඉවත් කරගෙන ඇත. එසේම විශ්‍රාම වැටුප් අංක 1145015 දරන අය 2018.09.27 දින මියගොස් ඇති අතර 2018 ඔක්තෝම්බර් මාසය වෙනුවෙන් මිනුවන්ගොඩ ලංකා බැංකුවේ ඔහුගේ ගිණුමට රු. 21,234 ක් යවා ඇති අතර එම මුදලද හිමි කරුවන් විසිනු ලබාගෙන තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකළ යුතුය. | මෙම මුදල් අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරී වෙත අවශ්‍ය උපදෙස්ද ලබා දී ඇත. |

**ආ) රජයේ ඉඩම්**

i. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| • දීමනා පත්‍රලාභීන්ට නීත්‍යානුකූලව හිමිකම පැවරිය හැකි අය සඳහා තම භුක්තිය පැවරිය හැකි වුවද මුදලට විකිණීමක් කල නොහැකි වුවත් බොහෝ ජනපදවල දීමනාපත්‍ර ලාභීන් තම ඉඩම් මුදලට විකුණා ඇති බව නිරීක්ෂණය විය. තවද වර්තමානය වන විට දීමනා පත්‍ර හිමි අය ඉඩමේ පදිංචි වී නැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් බලධාරීන් විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.<br>ජනපද 4 ක පැවති ඉඩම් කට්ටිවලින් 10 දෙනෙකු තම ඉඩම් විකුණා ද 17 ක දීමනා පත්‍ර ලාභීන් නොවන අය පදිංචිවද 7 ක පදිංචි වි නොමැති වද 34 ක අනවසර පදිංචි වීම්ද පැවතුණි. | නියමිත දීමනාපත්‍ර ලාභීන්ට ඉඩම් කට්ටි ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ජනපද 04 හි ඉඩම් කට්ටි පිළිබඳව පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය යටතේ ඉදිරි කටයුතු කරනු ලැබේ. |
| • 2018 වසර වන විට රජයේ ඉඩම් භුක්ති විඳිමින් අනවසර පදිංචිකරුවන් ලෙස 14 දෙනෙකු හඳුනාගෙන ඇති අතර ඔවුන් ජනපද මාර්ග සඳහා වෙන්කර ඇති ඉඩම් කට්ටි වල හා ඇල, දොල රක්ෂිතයන්ගේ පදිංචිව ඇති අතර ඊට අදාලව නඩු පවරා තීන්දු තීරණ ලැබී තිබුණද 2019 පෙබරවාරි 08 දින වන විටත් නිරවුල් ඉඩම් ලෙස පවරාගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. | අනවසරකරුවන් 05 දෙනෙකු සඳහා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත යටතේ කටයුතු සිදු කර නිරවුල් භුක්තිය ලබාගෙන ඇති අතර අනවසරකරුවන් 04 දෙනෙකු සඳහා සන්තකය ආපසු ලබාගැනිමේ පනත යටතේ නෙරපීම සඳහා අධිකරණ නියෝග ලබාගෙන ඇත. ඒ අනුව අදාල නියෝග ක්‍රියාත්මක කිරිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |

| | | |
|---|---|---|
| | | තවත් අනවසරකරුවෙකු භුක්ති විඳින ඉඩම් කොටස හඳුනා ගැනිමට හා අනුරේඛණයක් සකස්කර ගැනීමට මැනුම් ඉල්ලීමක් මිනින්දොරු අධිකාරි වෙත යොමු කර ඇත. |
| | | එසේම අංක.62805, 54046, 54047 යටතේ අනවසරකරුවන් තිදෙනෙකු සඳහා අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී. තවත් අනවසරකරුවෙකු සඳහා සන්තකය ආපසු ලබාගැනිමේ පනත යටතේ අස්කිරිමේ දැන්වීමක් නිකුත් කර ඇත. |
| • කොට්ඨාශයේ ඇති ජනපද ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සඳහා එනම් දීමනා පත්‍රයක් හෝ බලපත්‍රයක් නොමැති අය නියමානුකූල කිරීමට ජනපද 21 ක ඉඩම් කැබලි 71 ක්ද රණවිරුගම කැබලි 5 ක්ද අලවල අංගල්තැන්න රජයේ ඉඩමේ සියළු ඉඩම් කැබලි සඳහාද ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීම පිණිස 2018 ජනවාරි 25 වන දින දිස්ත්‍රික් පරිහරණ සැලසුම් කාර්යාලය වෙත යවා තිබුණද 2019 පෙබරවාරි 09 වන විටත් අනුමැතිය ලැබී තිබුනේ එක් ජනපදයක් සඳහා පමණි. එම නිසා මෙම ඉඩම් නියමානුකූල කිරීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කල නොහැකිව පැවතුණි. | අවශ්‍ය කටයුතු කඩිනමින් කල යුතුය. | කොට්ඨාශයේ ඇති ජනපදවල අනවසරයෙන් ඉඩම් කට්ටි 71ක පදිංචි කරුවන්හට ඉ.කො.ජ 2008/4 චක්‍රලේඛය අනුව කටයුතු කිරිම සඳහා ඉඩම් කට්ටිවල යෝග්‍යතාවය පරික්ෂා කිරිමට 2018.01.25 දිනැතිව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලය වෙත යොමු කර ඇත. ඉඩම් කට්ටි 07 ක් සඳහා කමිටුවේ අනුමැතිය ලබා දී ඇතත් ඉතිරි කොටස් සඳහා නිර්දේශ ලබාදෙන ලෙසට 2018.11.14 දිනැතිව සිහිකැඳවීමක්ද යොමු කර ඇත. අදාල නිර්දේශ ලද පසු ඉඩම් කච්චේරි යෝජනා සකස් කර පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| **ii. රජයේ ඉඩම් සඳහා නිකුත් කර ඇති දීමනා පත්‍ර පදිංචිකරුවන් වෙත ලබා නොදීම.** | | |
| දොම්පෙ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩම් වල පදිංචි වී සිටින අය වෙත ලබා දිම සඳහා ජනාධිපති අත්සන් කල දීමනා පත්‍ර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු අදාළ පුද්ගලයන් වෙත ලබා දිය යුතු වුවද, ග්‍රාම නිලධාරි වසම් 17 කට අදාළ කැබලි 33 ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රඳවා තබාගෙන ඇති අතර ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳව 2017 වර්ෂයේදී ග්‍රාම නිලධාරි වාර්තා ලබාගෙන තිබූ නමුත් මේවායේ ගැටළු නිරවුල් කර දීමනා පත්‍ර සංශෝධනය කර දීමට අවශ්‍ය ඉදිරි පියවර කිසිවක් ගෙන නොතිබුණි. | ගැටළු නිරවුල් කර දිමනා පත්‍ර ලබා දීමට කටයුතු කල යුතුය. | මෙම ඉඩම් කැබලි 33 පවතින ගැටළු නිරාකරණය කර ගැනිමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඉදිරියේදී අදාල දීමනා පත්‍ර ලබා දීමට බලාපොරොත්තු වේ. |
| **iii.** වත්තල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් ජනපද 34 කට අදාළව ඉඩම් කට්ටි 70 ක් සඳහා 2015 වර්ෂය තුල 43 ක්ද 2016 වර්ෂය තුල 24 ක් ද ලෙස බලපත්‍ර සකස් කර තිබුනද අදාල ඉඩම් හිමියන් වෙත ප්‍රදානය කර නොතිබුණි. | බලපත්‍ර හිමියන් වෙත බලපත්‍ර ප්‍රදානය කිරිමට අවශ්‍ය කටයුතු කල යුතුය. | ඉතිරි වී ඇති බලපත්‍ර ප්‍රදානය කිරිම සඳහා බලපත්‍ර හිමියන් වෙත ලිඛිතව හා ග්‍රාම නිලධාරී මගින් දැනුම් දී ඇති අතර ඉදිරියේදී මෙම බලපත්‍ර බෙදා දීමට කටයුතු කරනු ලැබේ. |
| **ඇ) වසා දමා ඇති පාසල් භූමි හා ගොඩනැගිලි** | | |
| **I. දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව** | | |
| • 2012 වර්ෂයේදී වසා දැමූ දිවුලපිටිය වෙලගාන පාසල 1960 දී පාසල් රජයට පවරා ගැනිම යටතේ අවු 75 කට බිම්බදු ක්‍රමයට බදු දි ඇත. එහි මුල් අයිතිකරු ගේ මුනුපුරා විසින් 2012.08.20 දින එය නැවත ආපසු පවරා දෙන ලෙස ඉල්ලා දිවුලපිටිය ප්‍රාදේශිය ලේකම් වෙත ලියකියවිලි ඉදිරිපත් කර තිබුණද එය නිරවුල් කර භාරදීමට හෝ ඵලදායි කාර්යයන් සඳහා යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි.<br><br>• 2013 වර්ෂයට පෙර වසාදමන ලද කුලි ගෙදර ප්‍රාථමික විද්‍යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල 2019 වර්ෂය වන විට ග්‍රාම නිලධාරි කාර්යාලය පිහිටා ඇති අතර 2013 වර්ෂයේදී කප්රුක් පුරවර සංවර්ධන වැඩ සටහන සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් හා පේෂ කර්මාන්ත දෙපාර්තුමේන්තුව විසින් ඉල්ලා ඇති නමුත් මේ කිසිදු කාර්යයක් සඳහා යොදවා නොතිබුණි. | ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීම කෙරේ අවධානය යොමු කල යුතුය. | මෙම රජයේ පාසල් තාවකාලිකව ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇත. ඉදිරියේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත මෙම පාසල් භාර දීමට සිදුවේ. දැනට මෙම පාසල් ගොඩනැගිලි රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි කටයුතු සඳහා භාවිතා කරනු ලබන අතර එම ප්‍රදේශවල පොදු කටයුතු සඳහා ද භාවිතා කරයි. |
| **ඇ) සේවා පියස්** | | |
| i. මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු . ලක්ෂ 70 ක | භාවිතයට ගැනීම | 2017 වර්ෂයේ වැඩ නිම |

| | | |
|---|---|---|
| වියදම් දරා 2017.12.31 දිනට වැඩ නිම කරන ලද සේවා පියස් 04 කින් 2 ක් භාවිතයට ගැනීම 2018.10.15 දින දක්වා ප්‍රමාද කර තිබූ අතර 2ක් භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රමාද කිරිම හා භාවිතයට නොගැනීමට හේතු විමසා බැලිය යුතුය. | කලද භාවිතයට ගැනීම ප්‍රමාද වූයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සේවා පියස් නිල වශයෙන් විවෘත කිරීම අපේක්ෂා කළ බැවිනි. |
| ii. මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 1987 - 2018 වර්ෂ අතර කාලය තුල ඉදිකර ඇති සේවා පියස් ගොඩනැගිලි සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| • 117/2 එල්ලංගල ග්‍රාම නිලධාරී වසමේ ඉදිකර ඇති සේවා පියස් ගොඩනැගිල්ල 2015 දී රු.300,000 ක් වැයකර ඉදිකර ඇති අතර මෙහි අත්තිවාරම මත ඉදිකල කණු 4 කින් හා වහලයකින් සමන්විත වන අතර මේ සඳහා ජලය, විදුලිය හා සනීපාරක්ෂක පහසුකම් නොමැති අතර මෙතෙක් භාවිතයටද ගෙන නොතිබුණි. | රජයේ ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගැනීම කෙරේ අවධානය යොමු කල යුතුය. | ඉහත සේවා පියස සම්බන්ධයෙන් තිබූ වැරදි නිවැරදි කිරීමට කටයුතු කල අතර මින් ඉදිරියට එවැනි වැරදිසිදු නොවීමට කටයුතු කරනු ලැබේ. |
| • වල්පිටමුල්ල ග්‍රාම නිලධාරී වසමේ පවතින සේවා පියස් ගොඩනැගිල්ල 2015 දී රු.300,000 ක ප්‍රතිපාදනවලින් අළුත්වැඩියා කර ඇති අතර 2019 වන විටත් මෙම ගොඩනැගිල්ල භාවිතයට ගැනීම සිදු නොවන අතර ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම්ද මෙහි නොමැති බව නිරීක්ෂණය විය. | රජයේ ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගැනීම කෙරේ අවධානය යොමු කල යුතුය | විදුලි පහසුකම් ලබාගෙන මහජන සේවාවන් පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| • 123/3 යටියන නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ ඉදිකල සේවා පියස් ගොඩනැගිල්ල 2017 දී වැඩ නිමකර ඇති අතර මෙම සේවා පියස් ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ රජයට අයත් නොවන ඉඩමක වන නිසා එම ඉඩමේ අයිතිකරුවන් විසින් 2018 වර්ෂයේදී මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ට එරෙහිව නඩුවක් ගොනු කර තිබුණි. | රජයේ ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගැනීම කෙරේ අවධානය යොමු කල යුතුය. ඉඩම් හිමිකම නොමැතිව ඉදිකිරීම් කිරිම පිළිබද සැලකිලිමත් විය යුතුය. | මෙම ඉඩම රජයේ ඉඩමක් බව පවසමින් ගම් වාසීන් විසින් ත්‍රීවීල් රථ ගාලක් පවත්වා ගෙන යෑම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. එම අවස්ථාවේදී මෙම ඉඩම පිළිබඳ තොරතුරු සොයා බැලීමේදී මෙම ඉඩමට හිමිකම් පාමින් පාර්ශව කිහිපයක් වරින් වර ඉදිරිපත් වුවද නිත්‍යානුකූල අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලිපිලේඛණ ඉදිරිපත් නොවූ. එම ඉඩමේ පිහිටි පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කර ජනතාවගේ ප්‍රයෝජනයට ලබා දෙන ලදී. උක්ත ඉඩමට යාබදව පිහිටි විවිධ සේවා සමූපකාරයට අයත් ගොඩනැගිල්ල සහිත ඉඩමේ ඔප්පුවේ හා |

පත්ඉරුවල එම ඉඩමට මායිම් වන මෙම ඉඩම රජයේ ඉඩමක් බව සටහන් වී ඇති බව සනාථ විය. මෙම ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල නිලසෙවන ඉදිකිරිමට සුදුසු රජයේ ඉඩමක් නොමැති බැවින් හා නිල සෙවනක දැඩි අවශ්‍යතාව මත ප්‍රදේශවාසීන් විසින් හා ඉහත සනාථ කර ගැනීම් අනුව මෙම ඉඩම රජයේ ඉඩමක් වශයෙන් සලකා 2017 වර්ෂයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ නිල සෙවන ඉදි කර ඇත.

### ඉ) ආපදා කළමනාකරණය

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කෙරේ.

I. පසුගිය වර්ෂ කිහිපයේදී ගම්පහ දිස්ත්‍රික්කය තුල මහා පරිමාණයෙන් හා සුළු පරිමාණයෙන් ඇති වූ ගංවතුර තත්ත්වයන් ඇති වීමට තුඩුදුන් හේතු සලකා බැලීමේදී ප්‍රාදේශීය මට්ටමින් පවත්නා ඇල මාර්ග වල අවහිරතා ඉවත් නොකිරීම, ඇල මාර්ගවල ජලය බැස යාම ක්‍රමවත්ව සිදු නොවීම හා ඇල මාර්ග සඳහා නිසි නඩත්තුවක් නොමැති වීම ප්‍රධාන කරුණු ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රතිසංස්කරණය කලයුතු හා පවිත්‍ර කලයුතු ඇල මාර්ග, බෝක්කු 111 ක් පිළිබඳවත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2019 මාර්තු වන විටත් කිසිදු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර නොතිබුණි.

ගංවතුර තර්ජනයට හේතු හඳුනාගෙන අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය.

මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයකට බලපෑ අතර එය හුදෙක් කාලගුණික වෙනස්වීම් මත සිදු වුවක් බව දන්වා සිටිමි.

මෙම ඇළ මාර්ග වලින් ඇතැම් ඒවා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරගෙන යනු ලබන අතර ඇතැම් ඒවා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නඩත්තු වේ. එමෙන්ම ජල බස්නා මාර්ග නඩත්තු කල යුත්තේ ප්‍රාදේශීය සභාව හා අදාළ පරිදි නගර සභාව විසින් බවත් සඳහන් කරමි. ඒ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවලදී දැනුවත් කර ඇතත් මෙම ආයතනවලින් අවශ්‍ය පරිදි ප්‍රතිපාදන නොලැබීමේ තත්වයක් පෙනේ. කෙසේ වුවද මේ පිළිබඳව අප වෙත ලැබෙන

| | | |
|---|---|---|
| | | ප්‍රතිපාදන වලින් හැකි සෑම අවස්ථාවකම කටයුතු කරන නමුත් සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය අප වෙත නොලැබේ. මීට අමතරව මෙම වර්ෂයේදී ඇති වූ ගංවතුරේදී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සම්බන්ධ කොට ගෙන අවහිර වූ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කල අතර ඵලදායීව මෙම කාර්ය වාර්ෂිකව සිදුවීමට නම් තෝරාගත් ජල බස්නා මාර්ග සෑම මාස 06 ට වරක්වත් අවම වශයෙන් ප්‍රතිසංස්කරණය කල යුතුව තිබේ. |
| • ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ලද ට්‍රැක්ටර් රථ 5ක් හා ජල බවුසර් 3 ක් 2017 වර්ෂය තුලදී දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත්වූවන් වෙත පානිය ජලය ලබාදිම සඳහා ටැක්ටර් ජල බවුසර් රථ තුනක් දිස්ත්‍රික් ලේකම් ගේ අනුමැතිය මත අඩුපාඩු රහිතව ක්‍රියාකාරි තත්වයෙන් යුතුව 2017.07.19 දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත භාරදී තිබුණි. 2018.04.05 දින අවිධිමත් ලෙස ආපසු භාරදී තිබූ මෙම රථ තුනටම බරපතල ලෙස හානි වී තිබූ බව පරික්ෂා කිරිමේ දී අනාවරණය වී ඇත. එම රථ අලුත්වැඩියා කිරිමෙන් තොරව නැවත ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ ඇති නමුත් 2019 මාර්තු වන විටත් එම තත්ත්වයේම පැවතිණි. | මෙවන් තත්වයන් ඇති වීමට බලපෑ හේතු විමසා අවශ්‍ය පියවර ගත යුතුය. | අදාළ වාහන නැවත අළුත් වැඩියාව සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර අදාළ ප්‍රතිපාදන ලබා දුන් පසු අදාළ කටයුතු සිදු කරමි. |
| • මෙම රථ අළුත්වැඩියා කර ආදායම් ඉපයීමේ කාර්යයක යෙදවිම හෝ සුදුසු පරිදි වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ජල බවුසර් ආරක්ෂිත පරිදි ගාල් කිරිමත් ඉන් ප්‍රයෝජන ගැනීමක් කෙරේ. අවධානය යොමු කල යුතුය. | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත. |
| **ඊ)** දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ආරම්භ කර තිබූ විවිධ ව්‍යාපෘති හේතුවෙන් ජන ජීවිතයට බලපෑම් එල්ලවී තිබිම.<br><br>පරිසරය සම්බන්ධයෙන් නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ගම්වාසින්ගේ අදහස් උදහස්ද සැලකිල්ලට නොගෙන සහ | පරිසර පද්ධතියට වන බලපෑම පිළිබඳ විරෝධතා පැවතිම සලකා බැලිම වඩා යෝග්‍ය වන අතර එය පිළිබඳ ඉදිරි | |

වගකිව යුතු නිලධාරින්ගේ අධික්ෂණයකින් ද තොරව රාජ්‍ය ආයතන විසින් විවිධ සමාගම් වලට ග්‍රාමීය ප්‍රදේශ තුල විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීමට ඉඩ ලබා දීම තුලින් පරිසරයට සහ ජලමූලාශ්‍ර වලට දැඩි හානි සිදුවී තිබූ අතර ඒ හේතුවෙන් ගම්වැසියන්ගේ ජීවනෝපාය මාර්ගයන්ට මෙන්ම ජීවන රටාවටද තර්ජන එල්ල වී තිබීමෙන් ගම්වාසීන් පීඩාවට පත්ව තිබූ අවස්ථා විගණනයේදී නිරික්ෂණය විය.

කටයුතු කල යුතුය.

**I. අගලේගෙදර - වල්පිට කටුවහේනවත්ත, ක්‍රොප්වීස් පුද්ගලික සමාගම් ඉඩමෙහි නළ ළිං කැණීම**

Lanka Deep Wells (Pvt) Limited ආයතනය විසින් භූගත නල ළිං ඉදිකිරීම සම්බන්ධයෙන් අගලේගෙදර පරිසරය සුරැකීමේ සංවිධානය විසින් 2018 මාර්තු 27 දින ප්‍රදේශවාසීන්ගේ අත්සනින් යුතුව විරෝධතා ලිපියක් ඉදිරිපත් කර තිබුණි. එම ලිපියට අනුව,

- එක් නළ ළිදක් ඉදිකිරීම සඳහා ජල සම්පත් මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන තිබුණ ද නළ ළිං හතරක් මේ වන විට ඉදිකොට ඇති බවත් නළ ළිං 03 ක් මගින් වගා කටයුතු සඳහා ජලය ලබා ගන්නා බවත්

- ක්‍රොප්වීස් පුද්ගලික සමාගම විසින් කෘෂි ව්‍යාපෘතියක් පවත්වාගෙන යන අක්කර 35 ක් වන ඉඩම මෙම ගම් ප්‍රදේශය හරහා ගලා බසින කෘෂි ඇලෙහි ජල පෝෂක ප්‍රදේශය වන අතර ඒ තුල පිහිටි සියළු ශාක ආවරණය ඉවත් කර තිබීම සහ අඩි 200 ක් පමණ ගැඹුරු නළ ළිං මගින් භූගත ජලය ලබා ගැනීම හේතුවෙන් එම ඇල සිදීයාමේ තර්ජනයට ලක්ව තිබෙන බවත්,

- මෙම ප්‍රදේශයේ ගම්වැසියන් බොහෝ දෙනෙකුගේ ජීවනෝපාය ගඩොල් කර්මාන්තය බැවින් මේ වන විට එම කටයුතු සඳහා ජලය සපයා ගැනීමේ දුෂ්කරතා මතුවී තිබෙන බවත් මෙම ප්‍රදේශය අවට ඉතා හොඳ මට්ටමක පැවති ළිං වල ජල මට්ටමද යම් ප්‍රමාණයකට පහත වැටී තිබෙන බවත්,

- එසේම මෙම ගම් ප්‍රදේශ වලට ජල සම්පත් මණ්ඩලය මගින් ජලය නොසැපයෙන අතර භූගත ළිං වලින් පමණක් ජලය සපයා ගන්නා බවත් ක්‍රොප්වීස් සමාගම අවට පිහිටි අනෙකුත් ගම්වලටද මෙම ජල මට්ටම පහත වැටීමේ තත්ත්වය බලපා ඇති බවත් අනාවරණය කර තිබුණි.

- ඒ හේතුවෙන් නියං සමයේදී ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ජල ටැංකි ස්ථාපිත කර ජලය ලබා දීමට කටයුතු කර තිබූ බවද නිරික්ෂණය විය.

මෙම කාර්යයන් සම්බන්ධ කටයුතු කිරීමේ පූර්ණ වගකීම ඇත්තේ ජල සම්පත් මණ්ඩලයටය හා අදාල පළාත් පාලන ආයතන වලට වන අතර ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ගැටළු මහජනතාව මතුකල අවස්ථා වලදී අදාල ආයතන වලට යොමු කිරීම කරනු ලබන අතර අදාල සියලුම ඉදිරිපත් වූ ගැටළු යොමු කර ඇත.

| | | |
|---|---|---|
| II. ජලය විකිනීමේ ව්‍යාපාරයක් හේතුවෙන් ප්‍රදේශවාසීන් ජල හිගයෙන් පීඩාවට පත් වී තිබීම.<br><br>මාහිංගමුව, වැලිඕවිට හේනවත්ත ඉඩමේ මහා පරිමාණ ලිදක් හාරා දෛනිකව ජලය ලීටර් 15000 ක පමණ බවුසර් 15-20 අතර ප්‍රමාණයක් අලෙවි කරනු ලබන බවත් ජලය ලීටර් ලක්ෂ 03 කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන පෙලේ කර්මාන්ත ශාලා රැසකට අලෙවි කරනු ලබන බවත් 2018 ජුලි 09 දින පැවති ප්‍රාදේශීය රැස්වීම් කමිටුවේදි අනාවරණය කර තිබූ අතර පසුගිය නියං කාලවලදී මෙම ඉඩමට යාබදව පිහිටි ගම්වල ජනතාව ජල හිගයෙන් මහත් පීඩාවකට ලක් වූ බවත් අනාවරණය වි තිබුණි. | ජන ජීවිතයට වන බලපෑම් පිළිබද සලකා බැලිය යුතුය. | මෙම කාර්යයන් සම්බන්ධ කටයුතු කිරිමේ පූර්ණ වගකීම ඇත්තේමධ්‍යම පරිසර අධිකාරිය, ජල සම්පත් මණ්ඩලයට හා අදාල පළාත් පාලන ආයතන වලට වන අතර ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ගැටළු මහජනතාව මතුකල අවස්ථා වලදී අදාල ආයත වලට යොමු කිරිම කරනු ලබන අතර අදාල සියලුම ඉදිරිපත් වූ ගැටළු යොමු කර ඇත. |
| • දිවුලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මඩිතියවල වත්ත ඉඩමේ කළුගල් කැණීමේ, කාපට් නිෂ්පාදනය කිරිමේ සහ වැලි සෝදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර මහජන විරෝධය පැවතියද මෙම ව්‍යාපාරය සඳහා 2015 වර්ෂයේ සිට වාර්ෂිකව කැනිම් බලපත්‍ර නිකුත් කිරිමට අදාළ ආයතන විසින් කටයුතු කර තිබුණි.<br><br>• මෙම ව්‍යාපෘතිය හේතුවෙන් එම කළුගල පිහිටි ප්‍රදේශය ආශ්‍රිත නිවාස වල බිත්ති පුපුරායාම, ළිංවල ජලය සිදියාම හා ප්‍රදේශවාසීන්ගේ එදිනෙදා ජන ජීවිතයට බාධා එල්ල විම ආදී නොයෙකුත් පාරිසරික ගැටළු වලට ප්‍රදේශ වාසීන්ට මුහුණ පෑමට සිදුවී තිබුණි.<br><br>• විශේෂ වෘක්ෂලතා වලින් ගහණ වූ මෙම කළුගල් ආශ්‍රිත ප්‍රදේශය කළුගල් කැණීම හේතුවෙන් විනාශයට පත් වූ බවත් කුඹුරුවලට ජලය ලබා ගන්නා ඇල මාර්ග හා ළිං සිදියාමට මෙහි ඉදිකර තිබූ නල ළිං ද හේතුවී තිබෙන බවත්, කැබලි වැටීමෙන් නිවාස වලට සහ කුඹුරු යායට අලාභ හානි සිදුවී තිබෙන බවත්, ඒ සම්බන්ධයෙන් ප්‍රදේශ වාසින්ගේ විරෝධතාවය ලිපි මගින් වගකිව යුතු නිලධාරින් වෙත වරින් වර දැනුම් දී තිබූ නමුත් විගණන දිනය වූ 2019 පෙබරවාරි 27 දින වන විටද මෙම ව්‍යාපෘතිය මගින් සිදුව තිබූ මහජන පීඩාවන් අවම කිරිමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ජන ජීවිතයට වන බලපෑම පිළිබද සලකා බැලිය යුතුය. | රජයේ කළුගල් කැණීම් සඳහා නිර්දේශයක් ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන්නේ ජල සම්පත් මණ්ඩලය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, නාගරික සංවර්ධන අධිකාරිය හා පරිසර අධිකාරිය යන ආයතනයන්හි නිර්දේශ හා ග්‍රාමීය පරිසර කමිටු නිර්දේශය ලබාගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර නිලධාරීන් ලවා ක්ෂේත්‍රය පරික්ෂා කිරීමෙන් පසුවය. මෙම ගැටළු මහජනතාව මතුකල අවස්ථා වලදී අදාල ආයතන වලට යොමු කිරිම කරනු ලබන අතර අදාල සියලුම ඉදිරිපත් වූ ගැටළු යොමු කර ඇත. |

**උ) වැලි හා මැටි කැණීම සඳහා බලපත්‍ර නිකුත් කිරිම**

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

- වැලි මැටි කැණීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික නිර්දේශය සහ කැණීම් නිසා භූගත ජලයේ සිදුවිය හැකි වෙනස්කම් සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේද නිර්දේශ සහිතව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් පෙන්වා දී තිබූ නීතිරීති හා කොන්දේසි වලට ද අනුකූලව කැණීම් කටයුතු සිදුකල යුතු බවට කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණද එහි සඳහන් කොන්දේසි වලට අනුව කැණීම් කටයුතු කරන්නේද යන්න පිළිබඳව අදාල ආයතන විසින් අධීක්ෂණ කටයුතු සිදු කෙරෙනවාද යන්නත්, එම කොන්දේසි කඩ කරන අවස්ථා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගනු ලබන්නේද යන්නත් විගණනයේදී තහවුරු නොවිය.

- ඒ හේතුවෙන් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කැණීම් කාර්යාංශය විසින් නිකුත් කර තිබූ බලපත්‍රයේ ඇතුලත් දෛනික හෝ මාසික උපරිම නිෂ්පාදන පරිමාව පිළිබඳ අධීක්ෂණ කටයුතු , කැණීම් කරනු ලබන වේලාව , කැණීම් සිදු කලයුතු ආකාරය, ප්‍රවාහන ක්‍රමය හා ප්‍රවේශ මාර්ග නඩත්තුව ආදී කොන්දේසි වලට අනුව මෙම කැණීම් සිදු කරන්නේද යන්න පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු නොවන බවත්, කැණීම් බලපත්‍ර දීර්ඝ කරගැනීමකින් තොරව කැණීම් කරනු ලබන අවස්ථා පවතින බවත් නිරීක්ෂණය විය.

අවස්ථා කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- 55 පැතිගොඩ ග්‍රාම නිලධාරි වසමේ මහවට්ටාරම් වත්ත වැලි හා මැටි කැණීම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය 2018 මැයි 14 දින අවසන්ව තිබුණි. මධ්‍යම පරිසර අධිකාරියේ අංක WPO/08/06/322/2012 හා 2018 අගෝස්තු 13 දිනැති ලිපියෙහි මැටි කැණීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කැණීම් බලපත්‍රය ලබා ගත යුතු බව සඳහන් කර තිබුණද විගණිත දිනය වූ 2019 පෙබරවාරි මස 27 දින වන විටද කැණීම් බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

- ජම්බුගහ ඕවිට වැලිකැණීම සඳහා නිකුත් කර තිබූ කැණීම් බලපත්‍රය 2018 ජුලි 08 දින අවසන්ව තිබූ නමුත් විගණිත දිනය වූ 2019 පෙබරවාරි 27 දින වන විටද බලපත්‍රය අළුත් කරගෙන නොතිබුණි.

අනිකුත් ආයතන වල නිර්දේශ කිරිම් හේතුවෙන් බලපෑම ඇතිවන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට වන බැවින් කොන්දේසි කඩ කිරිම පිළිබඳව නිරන්තරයෙන් එකී ආයතන දැන්වත් කර ජනතාවට වන බලපෑම අවම කිරිමට කටයුතු කල යුතුය.

පස් කැපීම සඳහා අයදුම් කිරීමේදී එම භූමිය සඳහා පුනරුත්ථාපන සැලැස්මක් භූ විද්‍යා හා පතල් කැණීම් සමීක්ෂණ කාර්යාංශය වෙත ඉදිරිපත් කල යුතුය. ඒ අනුව පුනරුත්ථාපන කටයුතු සිදුවන්නේද යන්න අධීක්ෂණයද කාර්යාංශය විසින් සිදුකල යුතුය. භූ විද්‍යා හා පතල් කාර්යාංශය මගින් නිකුත් කරන බල පත්‍රයේ කොන්දේසියක් ලෙසද එය ඇතුලත් කර ඇත. (1992 අංක 33 දරණ පතල් හා වාණිජ ද්‍රව්‍ය පනතේ ඉහත කටයුතු භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය වෙත පැවරී ඇත.)

මහජන පැමිණිලි හා විරෝධතා සම්බන්ධව නිරතුරුවම පරීක්ෂා කර බලා අදාල ආයතන දැනුවත් කර නිර්දේශ ලබාදීමට නොහැකි ස්ථාන සම්බන්ධව එම ආයතන වලට වාර්තා ඉදිරිපත් කර ඇත.

වැලි,මැටි හා බොරළු කැපීම සඳහා නිර්දේශයක් ප්‍රාදේශීය ලේකම් විසින්

| | | |
|---|---|---|
| • 60 A, බෝලගල ග්‍රාම නිලධාරි වසමේ වැලි කැණීම් කරතිබූ ආරච්චි කොටුව ඉඩමේ නැවත කැණීම් සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම්පතක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂණයකදි එම ඉඩමේ අඩි 15 - 20 දක්වා ගැඹුරට කැණීම් කර තිබූ බවත් එම ස්ථාන ජලයෙන් පිරි තිබූ බවත් නිරික්ෂණය කර තිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ කැණීම් බලපත්‍රයේ කොන්දේසි අංක 120 අනුව කැණීම් කරනු ලබන ගැඹුර අඩි 10 ට නොවැඩි විය යුතු බව සඳහන් කර තිබුණද අඩි 15-20 ගැඹුරට කැණීම් සිදුකර තිබීමෙන් කැණීම් බලපත්‍රයේ කොන්දේසි පිළිබඳව වූ පරික්ෂාවන් දුර්වල මට්ටමක පවතින බව නිරික්ෂණය විය. | | නිකුත් කරනු ලබන්නේ ජල සම්පත් මණ්ඩලය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, නාගරික සංවර්ධන අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනයන්හි නිර්දේශ හා ග්‍රාමීය පරිසර කමිටු නිර්දේශය ලබාගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර නිලධාරීන් ලවා ක්ෂේත්‍රය පරීක්ෂා කිරීමෙන් පසුවය.<br><br>කිසියම් විරෝධතාවයක් වාර්තා වන්නේ නම් එවන් ස්ථාන සඳහා නිර්දේශ ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදී නොමැත. එවැනි විරෝධතා වේ නම් බලපත්‍ර නිකුත් කරන භූ විද්‍යා හා පතල් කාර්යාශය වෙත දන්වා යවනු ලැබේ. |
| **ඍ) ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබාදීම.** | | |
| I. කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරින් තිදෙනෙකු අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගොස් තිබූ අතර 2017 ජූලි 03 දිනැති අංක BD / GPS / 130 / 09 / 14 / MC -8 චක්‍රලේඛය ප්‍රකාරව මෙම නිලධාරින්ගෙන් යතුරුපැදිවල වෙළඳපොළ වටිනාකම වන රු. 428,340 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>II. කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය අතහැර ගිය යතුරුපැදි ලබාගත් එක් සංවර්ධන නිලධාරියෙකුගෙන් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම වන රු. 138,500 ක් අයකරගෙන නොතිබුණි.<br><br>III. මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යතුරුපැදි | අදාළ මුදල් අය කර ගැනීම හෝ ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | මින් එක් නිලධාරියෙකු 2016.08.01 දින සිට විශ්‍රාම ගන්වා ඇති අතර මේ දක්වා විශ්‍රාම වැටුපද ගෙවනු නොලැබේ.<br><br>අනෙක් නිලධාරින් දෙදෙනා 2016.04.17 දින (අවු.55 දී) හා 2017.01.15 දින (අවු 57 දී) ඔවුන්ගේ ඉල්ලීම් මත විශ්‍රාම ගොස් ඇති අතර මෙම කටයුතුවල ඇති යම් අඩුපාඩු නිසා අදාල මුදල් |

| | | |
|---|---|---|
| ලබාගත් සංවර්ධන නිලධාරි III තනතුරේ අයකු ගුරු සේවයට අන්තර් ග්‍රහනය වීමත් ග්‍රාම නිලධාරි සේවයේ අයෙකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම යැමත් හේතුවෙන් සේවයෙන් ඉවත් වීම මත චක්‍රලේඛය ප්‍රකාරව රු. 283,420 ක වෙළඳපොල වටිනාකම අයකරගෙන නොතිබුණි. | | අයකර ගැනීම අතපසු වී ඇත. දැනට මොවුන් තිදෙනාගෙන්ම එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>අදාල නිලධාරිනිය නොදන්වා සේවයට නොපැමිණීම මත 2018.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කර රජයට අයවිය යුතු මුදල් පියවන ලෙස දැනුම් දී ඇත. මෙම මුදල් අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී කඩිනමින් මෙම මුදල් අයකර ගැනිමට බලාපොරොත්තු වේ. |

**එ) ජල ව්‍යාපෘති**

| | | |
|---|---|---|
| මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශීය අදාළව පහත කරුණු නිරික්ෂණය විය.<br><br>• කුඩාගොඩ නන්දනී පෙර පාසැල් භූමියේ නළ ළිදක් ඉදිකර විදුලි මෝටරයක් සවිකර රුදවුම් කුටියක් ඉදි කර ඒ මත ලීටර් 10,000 ක ප්ලාස්ටික් වතුර ටැංකියක් සවිකර පවුල් 80කට ජලය ලබාදීමට සැලසුම් කර තිබු අතර මේ සඳහා රු. 1,200,000 ක් වියදම් දරා තිබුණි.<br><br>2019 මැයි 06 දින සිදු කරන ලද භෞතික විගණන පරික්ෂාවේදී<br><br>ජල ව්‍යාපෘතියේ ජලය බෙදාහැරිම සඳහා පෙර පාසැල් භූමියේ එක් ජලකරාමයක් පමණක් ස්ථාපිත තර තිබු අතර පවුල් 80කට ජල සැපයුම ලබාදීමට සැලසුම් කර තිබුනත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. මෙවැනි ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දී ජලමුල සමිතියක් ස්ථාපිත කර පවත්වාගෙන යායුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>• පොල්වත්ත ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථාන භූමියේ නළ ළිදක් ඉදිකර ඒ මත ලිටර් 10,000 ක ප්ලාස්ටික් වතුර ටැංකියක් සවිකර ජල සැපයුම ලබාදිම සඳහා 2017 වර්ෂයේදි | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනිම කෙරේ අවධානය යොමු කල යුතුය. | මහජන අවශ්‍යතා හා ඉල්ලීම් මත මෙම ජල ව්‍යාපෘති ආරම්භ කලත් එම ජල ව්‍යාපෘති ස්ථානගත කිරිමේදී හා ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරිමේදී යම් ගැටළුකාරී තත්වයක් පැන නැඟී ඇත. මේ පිළිබඳව එම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක බලධාරියා වන ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කර ඇත. |

ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය භෞතික පරික්ෂාවේදී විහාරස්ථානයේ පිවිසුම ආසන්නයේ ජල කරාම 3 ක් ස්ථාපිත කර තිබුණි. පොල්වත්ත ග්‍රාමයේ ජලය ලබාදීමට 2019 මැයි වන විට කටයුතු කර නොතිබුණි.

- සුමුදු උයන වෙන්දේසි ඉඩමේ නළ ළිදක් ඉදිකර විදුලි මෝටරයක් සවිකර රැඳවුම් කුළුණක් ඉදිකර ඒ මත ලීටර් 10,000 ක් ප්ලාස්ටික් වතුර ටැංකියක් සවිකර ජල සැපයුම පවුල් 25 කට ලබාදීම සඳහා රු. 1,200,000 ක් වැයකර තිබුණි. ඒ පිළිබඳව සිදු කල භෞතික පරික්ෂාවේදි මෙම ව්‍යාපෘතියේ නළ ළිද සහිත ජල කුළුන ඉදිකර ජල ටැංකිය ස්ථාපිත කර තිබු නමුත් ක්‍රියාත්මකකිරිම සඳහා විදුලි සැපයුම ලබාදී නොතිබුණි. විදුලිය ලබා ගැනිමට 2018.07.19 දින රු. 19,765 ක් විදුලිබල මණ්ඩලය වෙත ගෙවීම් කර තිබුණි. එසේම නිවාස සඳහා ජලය ලබදිම ට අවශ්‍ය කටයුතු ඉටුකර තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i). ජ්‍යෙෂ්ඨ මට්ටම | 77 | 70 | 07 |
| (ii).තෘතියික මට්ටම | 31 | 24 | 07 |
| (iii).ද්විතියික මට්ටම | 3152 | 2669 | 483 |
| (iv).ප්‍රාථමික මට්ටම | 132 | 111 | 21 |
| එකතුව | 3392 | 2874 | 518 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දිමේ නිලධාරියාගේ අදහස් දැක්විම |
|---|---|---|
| අ) ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 13 ට අදාළව සමාලෝචිත වර්ෂය අවසානය වන විට තනතුරු 19 ක 518 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සපුරාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | ත්‍රෛමාසිකව හා මාසික වාර්තා වලින් නිලධාරී පුරප්පාඩු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. ද්විතියික මට්ටමේ පුරප්පාඩු වලින් බොහෝමයක් නව සංවර්ධන |

| | | |
|---|---|---|
| | | නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන්, කොට්ඨාශය වෙත ලබාදුන් පසු පිරවීමට හැකි බව වාර්තා කරමි. |
| **ආ)** ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13(3) ඡේදය ප්‍රකාර වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්වීමක් නොපමාව කළ යුතුය යනුවෙන් සදහන් වුවද එයට අදාළ නොවන ලෙස වසර කිහිපයක සිට ග්‍රාම නිලධාරි තනතුරු සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක 81 ක් සදහා වැඩ බැලීමේ පත්කිරීම් කර තිබුණද ඒ සදහා ස්ථිර නිලධාරියෙකු යොමුකර නොතිබුණි. | ස්ථිර නිලධාරියන් යොමු කිරිම කඩිනමින් කළ යුතුය. | නියමිත පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නිලධාරීන් ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්කයට අනුයුක්ත නොකිරීම හේතුවෙන් විගණන විමසුමේ දක්වා ඇති ආකාරයට ආයතන සංග්‍රහයේ විධි විධානවලට අනුකූල නොවන අයුරින් වැඩ බැලීමේ පත්වීම් සිදු කිරීම හැර වෙනත් ප්‍රතිකර්මයක් නොතිබිණි. |